# ගලිගමුව ප්‍රාදේශීය සභාව

# කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 07 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ගලිගමුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත ගිණුමේ රු. 6,236,941 ක ශේෂයෙහි සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ට අයත්, වටිනාකම රු. 1,090,000 ක ට්‍රැක්ටරයක් හා රු. 260,000 ක ට්‍රේලරයක් ඇතුලත් වීම හේතුවෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම වූ රු. 2,717,452 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 10 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 41,159,562 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 40,100,674 ක් වූයෙන් වෙනස රු. 1,058,888 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 161,716,013 ක් වූ ගණුදෙනු 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,556,882 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,688,442 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 2,085 | 1,641 | 444 |
| (ii) බදු කුලී | 442 | 442 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 414 | 414 | - |
| (iv) වෙනත් ආදායම් | 11,574 | 12,296 | - |

2.2.2 බදු කුලී

2012 වර්ෂය තුල බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සභා බල ප්‍රදේශයේ මාළු ලෑලි දෙකකින් අය විය යුතු රු. 356,268 ක මාසික බදු හා 10% ක දඩ මුදල් අය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 8,261,573 |
| (ii) මුද්දර ගාස්තු | 46,000 |

2.3 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීම සඳහා යොදා ගෙන තිබූ රු. 260,353,320 ක් වූ ජ'නල් සටහන් 88 ක් ගණන්දීමේ නිලධාරී විසින් අනුමත කර නොතිබූ අතර, 1988 ප්‍රාදේශීය සභා රීති අංක 166 ප්‍රකාරව සභාව විසින් ජ'නලයක් පවත්වා නොතිබුණි.

2.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) 2008 අගෝස්තු 07 දින සිට 2009 පෙබරවාරි 17 දින දක්වා මාර්ග පලුදු කිරීම් වෙනුවෙන් ලබාගෙන තිබූ රු. 49,750 ක තැන්පත් මුදල් එම මාර්ග පිළිසකර කිරීම සඳහා යොදා නොගෙන තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර අලෙවි කරනු ලබන ඉඩම් වෙන්දේසිකරුවන්ගෙන් ඉඩමේ ප්‍රමාණය මත 10% ක ඉඩම් කොටසක් පොදු පහසුකම් සඳහා සභාවට ලබා ගත යුතු වුවද, වෙන්දේසිකරුවන් විසින් කට්ටි කර විකුණන ලද අක්කර 04 කට වැඩි ඉඩම් දෙකකින් සභාවට හිමි විය යුතු රු. 2,829,050 ක් වූ පර්චස් 80.83 ක බිම් ප්‍රමාණයක් වෙන් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ගලිගමුව මහජන බැංකු ජංගම ගිණුමේ (සේවක ණය ගිණුමේ ) ශේෂය රු. 1,634,985 ක් විය. මාසික ලැබීම් හා ගෙවීම් විස්තර වලට අනුව එම ගිණුමේ අතිරික්ත තැන්පත් මුදලක් පවතින බව නිරීක්ෂණය වූ අතර, එම අතිරික්ත මුදල් සභාවට ආදායමක් උපයා ගත හැකි ආකාරයෙන් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කරළමනාකරණය